www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඇමරිකාවේ ජනාධිපති ධුරය විකිනීමට තිබේ

## The US presidency for sale

**2015 ජුලි 20**

2016 වසරේ ඇමරිකා එක්සත් ජනපද ජනාධිපති තරඟය ඉතිහාසයේ වැඩිම වියදම සහිත මැතිවරනය වනු ඇත. එහි මුලු වියදම ඩොලර් බිලියන 10ක් වනු ඇති බවට ගනන් බලා තිබේ. ඩිමොක්‍රටික් සහ රිපබ්ලිකන් පක්ෂ ද ඇතුලු සියලුම අපේක්ෂකයින්, සුපිරි ක්‍රියා කමිටු (පබ්ලික් ඇක්ෂන් කමිටු - පී ඒ සී ) හා වෙනත් මහ ව්‍යාපාරික ලොබි කිරීම් ද වෘත්තීය සමිති වල මැතිවරන වියදම් ගැන බලා එය ගනන් ගැනේ.

ඩිමොක්‍රටික් සහ රිබ්ලිකන් අපේක්ෂකයින් වියදම් කරන අති විශාල මුදල් සම්භාරයෙන් පෙන්නුම් කෙරෙන්නේ, ඇමරිකා එක්සත් ජනපදය යනු මහජනයා විසින් පාලන බලය දරන ප්‍රජාතන්ත්‍රයක් ය යන කියාපෑම බොරු විකාරයක් බව ය. ඇමරිකාව ඇත්ත වශයෙන්ම පාලනය කරන්නේ ලොකු සල්ලි කාරයන් විසිනි. නිලවශයෙන් පිලිගත් පක්ෂ දෙක අපේක්ෂකයන් තෝරාගැනීමේ පටන් 2016 නොවැම්බර් 8 ප්‍රතිඵල තීන්දු කිරීම දක්වා වන සියල්ල තීන්දු කරනු ලබන්නේ ධනකුවේරයන් විසිනි.

මේ වන විට, එකතු කර තිබෙන ඩොලර් මිලියන 390න් මිලියන 300ක්ම ගොස් තිබෙන්නේ රිපබ්ලිකන් පක්ෂයේ නාම යෝජනා ඉල්ලා තරඟ වැද සිටින අපේක්ෂකයන්ට ය. මිලියන 90 ක් වියදම් ව ඇත්තේ ඩිමොක්‍රටිකයන් හතර දෙනෙකුටය. ඉන් ඩොලර් - 71.5 ක්ම වියදම් ව ඇත්තේ ඩිමොක්‍රටික් අපේක්ෂකයන් අතර ඉදිරියෙන්ම ඉන්නා හිලරි ක්ලින්ටන් ටය. මෙම අසමානතාවය නොමග යවන සුලුය. පූර්ව වටය අවසන්වූ පසුව හා ක්ලින්ටන්ට මුහන දෙන රිපබ්ලිකානුවා තෝරාගැනීමෙන් පසුව, අවසන් මැතිවරන ව්‍යාපාරය තුල එක් එක් පාර්ශවයන් තවත් බිලියන ගනන් වියදම් කරනු ඇත.

ජනාධිපති තරඟයේ දි ලොකු සල්ලි වල ක්‍රියාකලාපය කොතරම් පැහැදිලිව තිබේදැයි කිවහොත්, මහා ව්‍යාපාර විසින් පාලනය කරන ජනමාධ්‍ය වලට ද එය තව දුරටත් වහංගු කල නොහැකිව තිබේ. උදාහරනයක් හැටියට *වොෂිංටන් පෝස්ට්* පත්‍රය ජුලි 16 වන දින පලකල වාර්තාවේ ශීර්ෂ පාඨය වෙනත් සිතලුවකට ඉඩ නොතබා මෙසේ හෙලි කලේය: "බලය පොහොසත් ප්‍රභූවේ සහය ලත් කන්ඩායම් අතට වැටෙන හැටි 2016 අරමුදල එකතු කෙරෙන සැටියෙන් පෙනී යයි." ප්‍රථම වතාවට ඊනියා "ස්වාධීන" සුපිරි පීඒසී සංවිධාන - අපේක්ෂකයින්ට ලිහිලෙන් සම්බන්ධවූ දේශපාලන ක්‍රියාකාරී කමිටු - මගින් කෙරෙන වියදම් ප්‍රමානය - පලමුවන වතාවට අපේක්ෂකයින්ට හා ඔවුන්ට ඍජුව සම්බන්ධ නිල මැතිවරන ව්‍යාපාරයන්හි වියදම ඉක්මවීමට යන බව ලිපිය පෙන්වාදුනි.

රිපබ්ලිකානුවන්ගේ පැත්තෙන් ඉදිරියෙන්ම සිටින්නේ ජෙබ් බුෂ් ය. ඔහු හිටපු ජනාධිපති ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් ගේ සහෝදරයාය, හිටපු ජනාධිපති ජෝර්ජ් එච්. ඩබ්ලිව්. බුෂ් ගේ පුතා ය. ඔහු ගේ මැතිවරන ව්‍යාපාරය ද ඔහු හා සම්බන්ධ සුපිරි පී ඒ සී දෙකක් ද 2015 තුන්වන කාර්තුවේදී ඩොලර් මිලියන 119ක් එකතු කලහ. ඒ වනාහි මැතිවරන ව්‍යාපාරයක මුලදීම ජනාධිපති අපේක්ෂකයෙකු විසින් මෙතෙක් එකතු කරනලද වැඩිම මුදල් ප්‍රමානයයි.

මේ මුදල සියල්ලම පාහේ එකතුකරනු ලැබුවේ සල්ලි කාර දායකයන් විසිනි. බුෂ් තම සුලු ආධාරකරුවන් සියලු දෙනාම දුන් ඩොලර් 368, 023 ට වැඩි, ඩොලර් 3999, 720 ක් තෙමේම සිය මැතිවරන අරමුදලට ලබාදුනි. ඔහුගේ පීඒසී ට එක් අයෙක් ඩොලර් මිලියන 1 බැගින් (මේ සීමාව නියම කරන ලද්දේ බුෂ් ව්‍යාපාරය විසින්ම ය) සැපයූ බිලියන හා බහු මිලියන පතියන් ගනනාවකට අමතරව, මූල්‍ය ජාවාරම්, තෙල්, තොග වෙලඳාම, නිශ්චල දේපල සහ තවත් ව්‍යාපාර සන්තතියක් නියෝජනය කරන ලොබි කාරයන්ගෙන් ද බුෂ්ට කාසි ලැබුනි.

සුපිරි පීඒසී ජාවාරම වනාහි 2010 දි ශ්‍රේෂ්ඨාධිකරනය විසින් දෙන ලද සිටිසන්ස් යුනයිටඩ් නඩු තීන්දුවේ ද ඉන් ඉක්බිති උසාවි තීන්දු ගනනාවක ද ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවූවකි. එම නඩු තීන්දු වලින් බිලියනපතියන් සහ සංගත විසින් පීඒසී වලට දිය හැකි ආධාර වලට තිබුනු සීමාව මුලුමනින්ම අහෝසි කර දැමුනි. (පුද්ගලික ආධාර කරුවෙකු විසින් අපේක්ෂකයෙකුට දිය හැකි මුදල තවමත් ඩොලර් 2,700කට සීමා කර ඇත.)

සුපිරි පීඒසී මුලින්ම වැදගත් භූමිකාවක් ඉටු කලේ, 2012 දී ය, ඒ ද ප්‍රධාන වශයෙන්ම රිපබ්ලිකානු අපේක්ෂකයා තෝරාගැනීමේ ප්‍රාථමික ව්‍යාරය තුලය. එහිදී ශෙල්දොන් අදෙල්සෝන් සහ ෆොස්ටර් ෆ්රීස් යන බිලියනපතියන් දෙදෙනා, බිලියන පතියෙකු වීමට ආසන්නව සිටි ආරක්ෂ අරමුදල් ජාවාරම් කාරයෙකු වූ මිට් රෝම්නි ට විරුද්ධව නිවුට් ගින්ග්රිච් සහ රික්

සන්ටෝරුම් යන අපේක්ෂකයන්ට ආධාර කලෝය.

2016 දී මෙය තවත් ප්‍රමානාත්මක ඉහල පිම්මක් ගෙන ඇත. සුපිරි පීඒසී හෙවත් පැක් ගිනුමෙන් රිපබ්ලිකන් අපේක්ෂකයන් ට ඩොලර් මිලියන 230 ක් සපයද්දී , අපේක්ෂකයන් තෙමේම එකතු කරගෙන ඇත්තේ ඩොලර් 65 මිලියනයක් පමනි.

සෑම වැදගත් රිපිබ්ලිකන් අපේක්ෂකයෙකුට ම බිලියනපති ආධාරකරුවෙකු සිටි. (ඩොනල්ඩ් ට්‍රම්ප් නම් ඔහුම බිලියන පතියෙකි) බිලියනපතියෙකු නැත්තේ කෙන්ටකි ප්‍රාන්තයේ රැන්ඩ් පෝල් ට පමනි. එක්සත් ජනපදය විදේශවල කරන යුද මදාවිවලට ඔහු ඉඳහිට දක්වන විරෝධතා නිසා බිලියනපති ආධාර ඔහුට නොලැබේ. ඔහුගේ මැතිවරන අවස්ථා ඒ නිසාම වේගයෙන් මැලවී ගොස් ඇත.

සුපිරි පැක් අරමුදල් වලින් පලමුවෙනියා බවට පත්ව සිටින්නේ ජෙබ් බුෂ්ය. පිලිවෙලින් ඩොලර් මිලියන 53 ක් හා මිලියන 44 ක් රැස්කරගෙන සිටින ටෙඩ් ක්‍රෑස් හා මාර්කෝ රුබියෝ යන සෙනෙට් සභිකයින් ද එමගින් බැරෑරුම් තරග කරුවන් බවට පත් ව සිටිති. ජුලි 13 දා තම අපේක්ෂකත්වය නිවේදනය කිරීමට පෙරාතුවම තවත් ප්‍රමුඛ රිපබ්ලිකානුවෙක් වන විස්කොන්සින් ආන්ඩුකාර ස්කොට් වෝකර්, සුපිරි පැක් මගින් ඩොලර් මිලියන 20ක් රොක් කර ගත්තේය.

සුපිරි පැක් අඩුවශයෙන් තවත් රිපබ්ලිකන් අපෙක්ෂකයන් දුසිම් බාගයකට වැඩි ගනනකට ආධාර සපයනු ඇත. ටෙක්සාස් ආන්ඩුකාර රික් පෙරී එකතු කර ගෙන ඇති ඩොලර් මිලියන 17න් මිලියන 16 ක්ම දී ඇත්තේ බිලියන පතියන් තුන් දෙනෙකු විසිනි. ලබන සතියේ අපේක්ෂකත්වය ප්‍රකාශ කරන්නට බලා සිටින ඔහියෝ ආන්ඩුකාර ජෝන් කසිච මිලියන 11.5 රැස්කරගෙන සිටින අතර නිව් ජර්සි ප්‍රාන්ත ආන්ඩුකාර ක්‍රිස් ක්‍රිස්ටි මිලියන 10 ද අලුතින් තරගයට බැස සිටින ලූව්සියානා ආන්ඩුකාරයාට මිලියන 9 ද පැක් මුදල් හිමිව තිබේ. හිටපු අර්කන්සාස් ආන්ඩුකාර මයික් හකබිගේ සහ හේව්ට් පැකාර්ඩ් සමාගමේ හිටපු ප්‍රධාන විධායක කාලි ෆියොරිනාගේ ද ජනාධිපති ව්‍යාපාරවල ට ලොකු සල්ලි ඇතිතරම ලැබී ඇත.

ඩිමොක්‍රටික් පක්ෂයේ පැත්තෙන් ද පවත්නේ මෙම සාරභූත යථාර්තයමයි. එය ආවරනය වී ඇතොත් ඒ ඩිමොක්‍රටික් පක්ෂය වැඩ කරන පන්තියේ පක්ෂයක්ය යන ව්‍යාජ යෙන් ද, හිටපු රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන්ගේ අපේක්ෂකත්වයට අභියෝග කරන සමහර ඩිමොක්‍රටික් පාක්ෂික තරග කරුවන්ගේ ගෝසාව ද හේතුකොට ගෙන ය.

ක්ලින්ටන්ගේ අරමුදල් රැස්කිරීම ගන්නේ ද රිපබ්ලිකන් අපේක්ෂකයන්ගේ රටාව ම ය. වෙනසකට ඇත්තේ තම පක්ෂයේ අපේක්ෂකයා තෝරාගැනීමේ දී දැඩි ප්‍රාථමික තරඟයක් අපේක්ෂා නොකරන ක්ලින්ටන් ගේ මූලෝපායඥයෝ, සිය මහ සල්ලි කර දායකයින්ට මහා මැතිවරන ව්‍යායාමය ඇරඹෙන තෙක් සිය මුදල් සැපයුම නොඅරඹන ලෙස කියා සිටීම ය. වොරන් බෆට්, මූල්‍ය සමපේක්ෂක ජෝර්ජ් සොරෝස්, සහ ආයෝජන බැංකු කාර ටොම් සේයාර් තම ප්‍රතිපදාන ලබන අවුරුද්ද තෙක් කල් තබාගෙන සිටිති.

එහෙත් ක්ලින්ටන් දැනටමත් යම් මුදල් ප්‍රමානයක් එකතු කරගෙන සිටින්නීය. ඒ විශේෂයෙන්ම හිම් සබාන් ද, ෆ්‍රෙඩ් ෆය්චනර් වැනි මාධ්‍ය බිලියන පතියන්ගෙන්, රක්ෂන අරමුදල් ව්‍යාපාරික ආලස්නි, හ්යට් පවුල් බූදලයේ ජ.බී. ප්‍රිට්සර්, රෝත්ස්චයිල්ඩ්හි ලින් ෆොරෙස්ටර් සහ වෙනත් හොලිවුඩ්, සිලිකන් වැලි සහ වෝල් වීදියේ ධන කුවේරයන් ගෙන් ය.

පසු ගිය සතියේ අඩුගනනේ ඩොලර් 100,000 ක් වත් ඇයට එකතුකර දුන් "සල්ලිකාරයන්" 122ක ගේ නම් වැලක් ක්ලින්ටන් සිය මැතිවරන වෙබ් අඩවියේ පල කලාය. මයික්‍රො සොෆ්ට්, එක්සන්, පෙප්සිකෝ, වෙරිසන්, මාස්ට කාඩ් සහ තවත් බොහෝ ගනනක් සමාගම් වල ලොබිකරුවෝ ඊට ඇතුලත් වූහ. ඉන් එක් අයෙක් හඳුනා ගැනීම වැදගත්ය. ඒ අලුතින් බඳවා ගන්නා මෝටර් රථ කම්කරුවන්ගේ වැටුප සියයට 50න් අඩු කල ඔබාමාගේ මෝටර් රථ කාර්ය සාධක බලකායට නායකත්වය දුන්, ආයෝජන බැංකුකරුවෙක් වන ස්ටීවන් රැට්නර් ය.

ඩිමොක්‍රටික් අපේක්ෂකත්වය සඳහා ක්ලින්ටන්ගේ ප්‍රධාන තරඟ කරුවා වූ සෙනට් මන්ත්‍රී බර්නි සැන්ඩර්ස්ට සුපිරිපැක් අරමුදලක් ඇත්තේ නැත. එහෙත් අන්තර්ජාලය හරහා ඔහු ඩොලර් මිලියන 5.2 ක් එකතු කරගෙන තිබේ. ඔහු ඇත්ත වශයෙන්ම ක්ලින්ටන්ට වෙනස් ලෙස, ඩොලර් 200 වැනි කුඩා ප්‍රමාන දුන් දායකයන් ගෙන් මුදල් එකතු කලේය. මින් පෙන්නුම් කරන්නේ සැන්ඩර්ස් ඉටු කරමින් සිටින්නේ ඔහුට බරකොට ඇති කටයුත්ත බවයි. එනම්, ඔබාමා පාලනාධිකරයේ දක්ෂිනාංශික පිලිවෙත් වලින් කලකිරීමට පත් අය තම බිලියනපති විරෝධී රංගනය මගින් ( සුපිරි පැක් මුදලක සහාය ලබා නොගැනීම ද ඇතුලු) ආකර්ෂනය කොට ගෙන ඔවුන් යලිත් වරක් ඩිමොක්‍රටික් පක්ෂයේ කක්ෂයට ඇද දැමීමය.

මේ සමස්ත වැඩ පිලිවෙලේ මොනම ප්‍රජාතන්ත්‍රවාදයක් වත් ඇත්තේ නැත. එය පෙන්නුම් කරන්නේ එක්සත් ජනපදයේ මහජන මතය අවුල් කොට ජනාධිපති තරඟයක දී ජනප්‍රිය අපේක්ෂකයෙකු තෝරා පත් කර ගැනීමට ඉඩක් තිබේය යන මිත්‍යාව තහවුරු කිරීමට, මූල්‍ය වංශාධිපතිත්වය අතිශයින්ම විනිවිද පෙනෙන සුලු කඩතුරාවන් යොදාගන්න සැටිය. මෙහිදී මූල්‍ය වංශාධිපත්‍යය යෙදී ගනු ඇත්තේ, අපේක්ෂකයන් දුවවා බලමින්, තමන් ගේ නියමය අකුරට ඉටුකරන කරන බව සැක හැර දැනගන්නා පුද්ගලයා තෝරා ධවල මන්දිරයේ පදිංචි කරවීමය.

**පැට්‍රික් මාටින්**

© www.wsws.org